# නවීන කෘෂි සංවර්ධනය සඳහා සාම්ප්‍රදායික ක්‍රම භාවිතය

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂි සන්නිවේදන ක්‍රම නවීන කෘෂි සංවර්ධනය සඳහා යොදා ගැනීමේ හැකියාව පිළිබඳ කරන පර්යේෂණාත්මක අධ්‍යයනයකි.

ඩබ්ලිව්. එම්. ආර්. ඩබ්ලිව්. විජේතුංග

කැලණිය විශ්ව විද්‍යාලයයේ සමාජ විද්‍යා පීඨයේ ජන සන්නිවේදනය

පිළිබඳ සමාජයිය විද්‍යාපති පර්යේෂණ උපාධිය

සඳහා ඉදිරිපත් කරන ලදී.

1998

## සාරාංශය

සන්නිවේදනය, මානවයාගේ පමණක් නොව හුදු සත්වයාගේ සමස්ථ ක්‍රියාවලින් සදහා ම අත්‍යවශ්‍ය වූ මෙවලමකි. සන්නිවේදනයෙන් තොර සත්වයාගෙන් ජීවිතයේ පූර්ණත්වයක් දැකිය නොහැකි ය. ගල් යුගයේ සිට මිනිසා තමන්ගේ දැනුම හා අත්දැකීම් සම්බන්ධ උචිත සන්නිවේදන කාර්යයේ නියුතව ඇත. එය රංගනය - ශබ්දය - රූපය ආදි වශයෙන් විකාශයට පාත්‍රව තිබේ. ක්‍රමිකව විකාශය වූ මිනිසා තම බුද්ධි වර්ධනයක් සමග භාෂාව - ලේඛනය - ඔස්සේ වත්මන් විද්‍යුත් තාක්ෂණය දක්වා ගමන් කර තිබේ. ඒ සෑම යුගයන් තුළ ම විවිධ තරාතිරම් ඔස්සේ සන්නිවේදනය සිදුව තිබේ. සත්වයාත්, සන්නවේදනයත් අතර පවතින ඇල බැදීම, සෑම යුගයක ම පවත්නා නටඹුන් - පුරාණ නිර්මාණ තුළ විද්‍යාමානව පවතී. ලෙනක පවතින චිත්‍රයක, ගෘහ නිර්මාණයක, ඇඳුමක, රතලයක, සඳකඩ පහනක හෝ පුස්කොළ පොතක ඉතිහාස ගත තොරතුරු අවාචිකව සන්නිවේදනය කෙරේ. මිනිසා ජීවත් වන වට පිටාව, ආර්ථික, ආගම, සිරිත් - විරිත් තුළ ඔවුන්ගේ සාම්ප්‍රදායික සංස්කෘතිමය සම්බන්ධය නිරායාශයෙන් ම සන්නිවේදනය විම වැළැවිය හැක්කක් නො වේ.

සාම්ප්‍රදායික කෘෂි අර්ථ ක්‍රමයේ පවත්නා විවිධ වූ ක්‍රම සමුදායයන් විශ්ලේෂණාත්මකව පර්යේෂණයට ලක් කිරීමේ දි ඔවුන් ඒ තුළින් ප්‍රකාශිත සන්දේශයන් කමක් ද? යන්න වටහා ගැනීම අපහසු නො වේ. ලාංකිය ශිෂ්ටාචාරය කෘෂි ආර්ථිකය පදනම්ව ගොඩනැගී ඇත. එහි අතීතය වසර 2500 කට ආසන්න ය. එය විවිධ දේශීය ක්‍රමවේදයන් ගෙන් පරිපූර්ණ ය.

දේශීය ක්‍රමවේදයන් යටපත් කරමින් බටහිර තාක්ෂණික ඥානය ප්‍රචලිත වුව ද, දේශීය ක්‍රමයන්හි රැඳී සිටීමේ ශක්තිය එසේම පවතිනු දැකිය හැකි ය. පාරම්පරික ගොවියා හුදු අන්ධානුකරණයෙන් මේවා ක්‍රියාත්මක නොකළ අතර, ඒ තුළ පවත්නා ජෛවීය - ඖෂධීය හෝ ආගමික සත්‍යතාව පිළිබඳව අවබෝධ කොට තිබිණි. කෙතක අටවන උගුලක, හේනක ගොඩ නගන පැලක, ප්‍රතිඵලයක් තිබුණි. මේවා තම බව - භෝග රැක ගැනීම කෙරෙහි දායක විය. අත් දැනීම්, පාරම්පරික හුරු පුරුදු ඔස්සේ එළඹෙන ගැටළුවට පිළියම් ගොඩ නැගී ය. වැටක තවරණ හුලංතලා කෙළයක පවතින දුග ද සතුන්ට බලපාන ආකාරය අවබෝධ කොට තිබු ඔවුන්, එම චින්තනය උපයෝගී කොට ඇත්තේ,

සත්වයාගේ විනාශයට නොව බව භෝග සුරැක වයාත් එලදායි අස්වැන්නක් රැස්කර ගැනීමට ය.

කෘෂිය අත්තම මගින් තම ආර්ථික පැවැත්ම ගැනීමට ගුරු - පුරුදුකොට තිබූ ආර්ථික රටාව, නවීන තාක්ෂණයත් සමග දෙදරා යෑමට පටන් ගැනින. ඒ සමග අත්පැල් බැදගත් සහෝදරත්වය, සහයෝගය බෙදා හදා ගැනීමේ පුරුද්ද ජන සංස්කෘතිය තලින් බැහැර වන්නට විය. එහෙත් ලාංකිය කෘෂි ආර්ථිකය පිළිබඳ දැඩි විමසිල්ලට ලක් කිරීමේ දී සියල්ල නොවෙතත්, ඉන් කොටසක් තවමත්, ක්‍රියාශීලීව පවත්නා බව පෙනේ.

ගුරුළු පෝෂිත වල ප්‍රදේශයෙහි පාරම්පරික ගොවිගු ගේන් ගොවිතැනේ දී ත්, මඩ ගොවිතැනේ දී ත්, මෙම ක්‍රමයයන් ප්‍රදේශයට ආවේනික ආකාරයට යොදා ගනිති. සාම්ප්‍රදායික හා නවීන ක්‍රමයන් මිශ්‍රව යොදාගනු ලැබූ ව ද, පාරම්පරික ක්‍රමයන් කෙරෙහි පවතින විශ්වාසය නො අඩුව පවතී.

දෙවන, තෙවන පරම්පරාවන් නවීන තාක්ෂණය හා වෙළඳ පොළ ආශ්‍රිත නිෂ්පාදන කෙරෙහි අවධානය යොමු කිරීම, පහසුව හා කාලය විශේෂත්වයට ගැනීම දේශිය ක්‍රමෝපායයන්ට එල්ල වෙමින් පවතින බාධකයන් ය. විශේෂයෙන් ම නවීන යොයා ගැනීම් නිවැරදියැ යි වෙළඳ ආයතන මගින් නිතර ගෙන - එන ප්‍රබල මතයන් වානිජ රැල්ල ඔස්සේ පාරම්පරික ගොවින් වෙත ද, ප්‍රවේශ වීම වළකාලිය නො හැක. එහෙත් කෘෂි ක්ෂේත්‍රය හා බැඳුන් තිර සාර සංවර්ධනයේ ඇතැම් අහිතූ ඵල විපාක කොතෙක් වුව ද, ඒවා ග්‍රහනයට දක්වන ඇල්ම වැඩි වෙමින් පවතී.

එහෙත් දීර්ඝ කෘෂි සංස්කෘතියක් සහිත ලාංකිය අර්ථ ක්‍රමය වස - විෂෙන් තොර සාම්ප්‍රදායික ක්‍රම රැසකින් සන්නද්ධ ය. සාර ධර්ම අතින් පොහොසත් ය. ඒවායින් සන්නිවේදනය වන සංවර්ධන පණිවුඩ නිවැරදිව හඳුනා නො මැත්තේ ද? ඒ වායේ සත්‍යතාව කෙබඳු ද? යන තත්ත්ව දිගු වශයෙන් විමර්ශනය කොට හඳුනා ගැනීම කාලීන අවශ්‍යතාව වී තිබේ. බටහිර චින්තනයේ දෘෂ්ටියෙන් දේශිය ක්‍රමයන් විමසීමට ලක් කොට ඒවායේ හරවත් භාවයත්, දේශිය අනන්‍යතාවත්, වියැකියාමට ඉඩ හරින්නේ ද? එසේ නොමැති නම්, ඒවායේ මිථ්‍යා විශ්වාස ආකල්ප බැහැර කොට සංවර්ධනය සඳහා උපයෝගී කරගත හැකි ද යන්න විමසිය යුතු ය.

මෙහි කාර්යයේ දී පාදක ප්‍රදේශය ආශ්‍රිත කණ්ඩායම් සාකච්ඡා, අහඹු නිරීක්ෂණ, ග්‍රන්ථ හා ලිපි ලේඛන පරිශීලනය මෙන් ම ප්‍රශ්නාවලියක් මගින් කරුණු රැස් කිරීම සිදු කර තිබේ.

සියලු කරුණු විශ්ලේෂණයේ දී පැහැදිලිව පෙනී යන කරුණක් වනුයේ, තිරසාර සංවර්ධන සංකල්පය හා දේශීය සාම්ප්‍රදායික ක්‍රම වේදයන් අතර පරස්පරතා ඇත්තේ වුව ද සාම්ප්‍රදායික ක්‍රම තුළ නවීන ක්‍රමයන් හා බද්ධ කළ හැකි විධීන් හඳුනා ගත හැකි බවත්, ජන මාධ්‍යය මෙය ක්‍රමවත් ව ජනතාව අතරට ගෙන යැමේ කාර්යයට විධිමත් ව උරදිය යුතු බවත් ය.